ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල.

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1. <u>මතය</u>

2011 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2. <u>මූල්‍ය සමාලෝචනය.</u>

2.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,584,552 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,415,930 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.1,831,378 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රතිඵලය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු පහතින් දැක්වේ.

| <u>ආදායම්/වියදම් විෂයය</u> | වාසිදායක/<br><u>(අවාසදායක) බලපෑම</u><br>රු. |
|---|---|
| බැංකු ණය පොලී වියදම් අඩුවීම | 2,083,516 |
| අඩමාන ණය අධි වෙන්කිරීම | 91,000,000 |
| වෙනත් ආදායම් වැඩිවීම | 1,343,056 |
| වෙනත් වියදම් අඩුවීම | 488,493 |
| භාණ්ඩාගාර බිල්පත් ආදායම අඩුවීම | (4,188,940) |
| ණය පොලී ආදායම් අඩුවීම | (82,351,510) |
| අනෙකුත් වියදම් වැඩිවීම | <u>(10,205,993)</u> |
| මූල්‍ය ප්‍රතිඵලයෙහි ශුද්ධ අඩුවීම | <u>(1,831,378)</u> |

3. <u>මෙහෙයුම් සමාලෝචනය.</u>

3.1. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා.</u>

අරමුදලේ අරමුණු වලට පටහැනිව, කිසිදු ඇප සුරුකුමක්ද ලබා නොගෙන 2007, 2009 සහ 2011 වර්ෂයන්හිදී රාජ්‍ය ආයතන දෙකකටත් පෞද්ගලික සමාගමකටත් ලබාදී තිබුණු මුළු ණය මුදල රු.124,940,133 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). අරමුදලේ අරමුණු වලට පටහැනිව ණය නිකුත් කරන බව ඒ ඒ ණය මුදල් නිකුත් කළ වර්ෂ වලදීම හෝ ඊට පසු වර්ෂයේ දී විගණකාධිපති වාර්තා වලින් පෙන්වා දී තිබියදීත්, නැවත නැවතත් ණය මුදල් නිකුත් කරන බව, 2011 වර්ෂයේ දී ද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය වෙත රු.5,000,000 ක ණය මුදලක් නිකුත් කර තිබීම

මගින් තහවුරු විය. එම ණය මුදල 2011 අප්‍රේල් 30 දින නිකුත් කර 2011 ජූලි 31 දින වන විට ආපසු අයකරගෙන තිබුණු නමුත් අදාළ කාලය සඳහා පොලියක් අයකර නොතිබුණි. මෙම රු.5,000,000 භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කළේ නම් ලබාගත හැකිව තිබුණු පොලී ආදායම රු.86,250 ක් පමණ විය.

(ආ). 2009 වර්ෂයේ දී රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත නිකුත් කර තිබුණු රු.100,000,000 ක් වූ ණය මුදලෙන් 2011 දෙසැම්බර් 31 දින වන විට හිඟ ණය මුදල රු.86,250,000 ක් විය. ණය මුදල සඳහා 27% ක වාර්ෂික පොලියක් අය කිරීම අරමුදලේ අපේක්ෂාව වූ බැවින් 2011 දෙසැම්බර් 31 දින වන විට රු.66,108,945 ක් පොලී ආදායම් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. නමුත් මෙම සම්පූර්ණ පොලී ආදායම 2011 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිට පවතින බව නිරීක්ෂණය විය. එසේම ගෙවීම අපහසු බව පවසමින් ණය පොලිය කපා හරින ලෙස රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් කරන ලද ඉල්ලීමකට අනුව සහ මහාභාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, ණය පොලිය කපාහැරීමට අරමුදලේ කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම ණය මුදල නිකුත් කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම පිණිස 2009 වර්ෂයේ දී රු.80,000,000 ක බැංකු ණයක් අරමුදල විසින් ලබාගෙන තිබුණු අතර 2010 වර්ෂය තුළදී එම ණය මුදල අරමුදල විසින් පියවා අවසන් කර තිබුණි. 2009 සහ 2010 වර්ෂ වලදී එම බැංකු ණය සඳහා අරමුදල විසින් ගෙවා තිබුණු මුළු ණය පොලිය රු.13,317,925 ක් විය. ඒ අනුව මෙම ගනුදෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දින වන විට අරමුදලට සිදුවී තිබුණු පාඩුව රු.13,317,925 ක් වන බව තහවුරු විය.

(ඇ). 2007 වර්ෂයේ දී අරමුදල විසින් පෞද්ගලික සමාගමක් වෙත ලබාදී තිබුණු ණය මුදල රු.19,940,133 ක් වූ අතර 2011 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ ණය මුදල ආපසු අයකර තිබුණි. ණය මුදල නිකුත් කිරීමේ දී 24% ක පොලී ආදායමක් ලබා ගැනීම අරමුදලේ අපේක්ෂාව වී තිබුණු බැවින් 2011 දෙසැම්බර් 31 දින වන විට ගිණුම් ගත කර තිබුණු මුළු පොලී ආදායම රු.15,363,926 ක් විය. නමුත් එම සම්පූර්ණ ණය පොලී ආදායම 2011 දෙසැම්බර් 31 දින වන විට හිඟ හිට පවතින බව නිරීක්ෂණය විය. අදාළ සමාගම විසින් කරන ලද ඉල්ලීමකට අනුව සහ මහාභාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, සම්පූර්ණ පොලී ආදායම කපාහැරීමට අරමුදලේ කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබුණි. මෙම රු.19,940,133 භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කළේ නම් ලබා ගත හැකිව තිබුණු පොලී ආදායම රු.7,000,000 ක් පමණ විය.

4. <u>පද්ධති හා පාලන අඩුපාඩු.</u>

එකිනෙක ඇප සුරැකුම්පත් වෙනුවෙන් විවිධ ගාස්තු ප්‍රමාණයන් අයකර තිබුණු අතර අයකරන ගාස්තු ප්‍රමාණය කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. එසේම කළමනාකරණ මණ්ඩලය සතු එම බලය කිසිම නිලධාරියෙකු වෙත හෝ කමිටුවක් වෙත පවරා දී නොතිබුණි.